# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2026.03.10 පැය 0540 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/420/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. වෙඩිතබා මනුෂ්‍ය ඝාතනයකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2026.01.16 වන දින වෙරළබඩ පොලිස් වසමේ ජින්තුපිටිය ප්‍රදේශයේදී වෙඩි තබා පුද්ගලයෙකු ඝාතනය කර දරුවන් දෙදෙනෙකුට තුවාල සිදුකිරීමේ අපරාධය සම්බන්ධයෙන් පොලිස් කණ්ඩායම් කිහිපයක් මඟින් විමර්ශන ආරම්භ කර තිබුණි.

ඒ අනුව විමර්ශන සිදුකළ කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමකට ලද තොරතුරකට අනුව ඉහත අපරාධයේ වෙඩික්කරුවෙකු 2026.03.09 දින උඩවලව ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු අවුරුදු 25 ක් වන කොළඹගෙආර, උඩවලව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම වෙඩි තැබීමට සම්බන්ධ වෙඩික්කරුවෙකු ලෙස ක්‍රියා කළ එක් සැකකරුවෙකු 2026.03.03 වන දින කොළඹ අපරාධ කොට්ඨාසය මඟින් අත්අඩංගුවට ගෙන තිබුණි.

කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මනුෂ්‍ය ඝාතනයක් - කයිට්ස් පොලිස් වසම.**

2026.03.09 දින සවස කයිට්ස් පොලිස් වසමේ නාගදීපය ප්‍රදේශයේ නිවසක පුද්ගලයෙකු තුවාල සහිතව මියගොස් ඇති බවට කයිට්ස් පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු අවුරුදු 45 ක් වූ නාවලපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු සමඟ පෙර ඇති වූ ආරවුලක් මත තවත් පුද්ගලයෙකු විසින් පිහියෙන් ඇන මෙම ඝාතනය සිදු කර ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. අවුරුදු 35 ක් වන කොටගල ප්‍රදේශයේ පදිංචි මෙම

ඝාතනයට සම්බන්ධ සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර කයිට්ස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකාරියක් අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය

2026.03.09 දින සවස ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 100 ක් සමඟ සැකකාරියක් අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකාරිය අවුරුදු 48 ක් වන රතමලාන ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

ගල්කිස්ස පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. සම්භාහන මධ්‍යස්ථානයක් මුවාවෙන් පවත්වාගෙන ගිය ගණිකා නිවාසයක් වටලා සැකකාරියන් 06 දෙනෙකු හා සැකකරුවෙකු අත්අඩංගුවට - සීදූව පොලිස් ස්ථානය.

2026.03.09 වන දින සවස් කාලයේ සීදූව පොලිස් වසමේ මීගමුව පාර ප්‍රදේශයේදී සීදූව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර සම්භාහන මධ්‍යස්ථානයක් මුවාවෙන් පවත්වාගෙන ගිය ගණිකා නිවාසක් වටලා ගණිකා නිවාසයක් කළමනාකරණය කිරීම සම්බන්ධව සැකකරුවෙකු සහ ගණිකා සේවයේ යෙදීම සම්බන්ධව සැකකාරියන් 06 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන ඌරගස්මංහන්දිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර සැකකාරියන් අවුරුදු 25 ත් 40 ත් අතර වයස්වල පසුවන කඩුවෙල, ගම්පහ,මීගමුව,පදලංගල හා මාතලේ යන ප්‍රදේශවල පදිංචිකාරියන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. පුද්ගලයින් සිව් දෙනෙකු දුම්රියේ ගැටී එක් පුද්ගලයකු ජීවිතක්ෂයට- පිංවත්ත පොලිස් වසම.

2026.03.09 වන දින සවස පිංවත්ත පොලිස් වසමේ තල්පිටිය පාලම මතදී බෙලිඅත්ත සිට මරදාන දක්වා ධාවනය වූ සීඝ්‍රගාමී දුම්රියේ පුද්ගලයින් සිව් දෙනෙකු ගැටී එක් පුද්ගලයෙකු මියගොස් ඇති බවට ලද පණිවිඩයකට අනුව පිංවත්ත පොලිසිය විසින් විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 87 ක් වන එංගලන්ත ජාතිකයෙකි.**

විදෙස් ජාතික යුවලක් හා ශ්‍රී ලාංකික පුද්ගලයෙකු හා ඔහුගේ දරුවා මෙලෙස අනතුරට පත් ව ඇති අතර මොවුන් දුම්රිය මාර්ගයේ සිට ඡායාරූප ගනිමින් සිටියදී මෙලෙස අනතුරට ලක්ව ඇති බවට සිදුකරන ලද විමර්ශනයේදි අනාවරණය වි ඇත.

තුවාලකරුවන් පානදුර රෝහලේ ප්‍රතිකාර ලබන අතර පිංවත්ත පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. ලොරි රථයක ගැටී පදික කාන්තාවක් ජීවිතක්ෂයට - බණ්ඩාරගම පොලිස් වසම.

2026.03.09 දින දහවල් බණ්ඩාරගම පොලිස් වසමේ බණ්ඩාරගම කැස්බෑව මාර්ගයේ ගහබඩ පාරට හැරෙන හන්දිය ආසන්නයේදී කැස්බෑව දෙසට ධාවනය වූ ලොරි රථයක් මාර්ගය හරහා ගමන්කල පදික කාන්තාවකගේ ගැටී රියදුරුට රථය පාලනය කරගත නොහැකිව වෙළඳසැලක හා ඒ අසල නවතා තිබූ කාර් රථයකද ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදික කාන්තාව බණ්ඩාරගම රෝහලට ඇතුලත් කරන විටත් මියගොස් සිට ඇත.

**මරණකාරිය අවුරුදු 72 ක් වූ කිදෙල්පිටිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

බණ්ඩාරගම පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. යතුරුපැදියක් ගසක ගැටී යතුරුපැදිකරු ජීවිතක්ෂයට - තලාව පොලිස් වසම.

2026.03.09 දින දහවල් තලාව පොලිස් වසමේ තලාව කැකිරාව මාර්ගයේ කිලෝමීටර් 36 කණුව අසලදී කැකිරාව දෙසට අධික වේගයෙන් ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කරගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන ගසක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු බරපතල තුවාල ලබා තලාව රෝහලට ඇතුළත් කර පසු වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු අවුරුදු 45 ක් වූ මහඉලුප්පල්ලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තලාව පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**